රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 14/2010

මගේ අංකය: COM 2/TRANS/03/0017
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2010.08.31

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් -2011

රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ ස්ථාන මාරුවීම් 2011 ජනවාරි මස පළමුවන දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කළ යුතු අතර එහිදී නිලධාරීන්ට මෙන්ම රාජ්‍ය සේවාවටද ඇතිවන අපහසුතා මගහැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරුවීම් පිළිබඳ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට සැළකිලිමත් විය යුතුය.

03. ස්ථාන මාරු මණ්ඩලය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේදී පැවැත්වෙන අතර එහිදී සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් ආයතන අතර ස්ථාන මාරුවීම් පිළිබඳ තීරණ ගනු ඇත.

04. ස්ථාන මාරුවීම් සඳහා නිලධාරීන්ගේ සුදුසුකම් ආදිය ගැන තීරණ ගැනීමේදී මේ සමග අමුණා ඇති මාරුවීම් පරිපාටිය උපයෝගී කරගනු ලැබේ.

05. පහසු සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් /දුෂ්කර සේවා ස්ථානයක අවුරුදු 02ක සේවා කාලයක් ඇති නිලධාරියෙක් ස්ථාන මාරුවීම් ලැබීමට සුදුසුකම් ලබයි.

06. ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුව අභියාචනා මණ්ඩල පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කල යුතුය. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු ලබන්නේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල වේ නම් පමණි.

07. ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා අභියාචනා මණ්ඩල විසින් පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තිවලට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්.
- නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු නොවූ අවස්ථා.
- නිලධාරීන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්.
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධාරීන්ට සිදුවූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව.

08. 2010 සැප්තැම්බර් 06 දින සිට 2010 දෙසැම්බර් 31 යන දින අතර කාලයේදී සාමාන්‍ය ස්ථාන මාරුවීම් සඳහා යෝජනා ඉදිරිපත් නොකළ යුතුය.

09. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ නිලධාරීන් සම්බන්ධව ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කාල සටහන අනුගමනය කල යුතුය.

| | | |
|---|---|---|
| සැප්තැම්බර් 03 ට පෙර | - | ස්ථානමාරු පරිපාටිය/චක්‍රලේඛය ප්‍රසිද්ධ කර ඉල්ලුම්පත් කැඳවීම. |
| සැප්තැම්බර් 30 ට පෙර | - | අංක 01 ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීම. |
| ඔක්තෝබර් 15 ට පෙර | - | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මාරු මණ්ඩල රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් වීම. |
| ඔක්තෝබර් 31ට පෙර | - | ස්ථාන මාරු තීරණ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙත දැන්වීම. |
| නොවැම්බර් 15 ට පෙර | - | ස්ථානමාරු පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත අභියාචනා භාරගැනීම අවසන් කිරීම. |
| නොවැම්බර් 25 ට පෙර | - | එම අභියාචනා පිළිබඳ තීරණ ගැනීම. |
| දෙසැම්බර් 10 ට පෙර | - | අභියාචනා පිළිබඳ තීරණ දැනුම් දීම අවසන් කිරීම. |

10. සෑම නිලධාරියෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙලිවුවහොත් ඒ පිළිබඳව අදාල ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස්කල හා හරි වැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතු වලටද යටත් වේ.

11 මාරු මණ්ඩල මගින් අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කල යුතුය.

12. වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් ලැබූ සියළුම නිලධාරීන් නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කල යුතුය.

13. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අධිපන්තියේ නිලධාරීන් වෙත දැන ගැනීමට සලස්වන්න.

ඩී.දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

වාර්ෂික ස්ථානමාරු ඉල්ලුම්පත් ආකෘතිය

| | |
|---|---|
| නිලධාරියාගේ පත්වීම් ලිපියේ අංකය | |
| නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය | |

## වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත
## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තිය

01. දැනට සේවය කරන
    අමාත්‍යාංශය :-..........................................................................................
    දෙපාර්තමේන්තුව:-......................................................................................
    කාර්යාලය :-............................................................................
    කාර්යාලය පිහිටි නගරය :-.......................................................

02. i. නිලධාරියාගේ සම්පූර්ණ නම (පත්වීම් ලිපියේ පරිදි)..................................................
    ...........................................................................................................................
    ii. නිලධාරියාගේ ස්ථිර (පෞද්ගලික) ලිපිනය :-..............................................................
    ...........................................................................................................................
    iii. නිලධාරියා දැනට පදිංචි ලිපිනය :-............................................................................
    ...........................................................................................................................
    iv. දැනට පදිංචි ස්ථානයට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :-..............................
    ...........................................................................................................................

03. i. උපන් දිනය :- ...........................................
    වයස (2010.12.31 දිනට) අවු............. මාස ........... දින .........

    ii. ස්ත්‍රී/පුරුෂ භාවය :- ......................

04. (අ) නිලධාරියා/නිලධාරිණිය විවාහකද/අවිවාහකද යන වග :-

    i. දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :-.......................................................................
    ii. පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් දැනට ඉගෙනුම ලබන පාසල්: .............................
    ...........................................................................................................................
    iii. කලත්‍රයාගේ නම සහ සේවා ස්ථානයක් වේ නම් , සේවය කරන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- .........................................................................
    තනතුර :- ...............................................
    නගරය :- ................................................

    iv. කලත්‍රයා ස්ථානමාරු සඳහා ඉල්ලීමක් කර තිබේනම් ඒ කුමන අමාත්‍යාංශයකටද/දෙපාර්තමේන්තුවකටද ?

    v. තම කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතුද එසේ නම් ඔහු හෝ ඇය අයත්වන සේවාව හා තනතුර :-...............................................................
    (ක්‍රියාන්විත සේවයේ නිරතවීම සනාථ කිරීම සඳහා සේවා ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් අමුණන්න)

(ආ) සේවයට ඇතුලත්වූ දවසේ සිට මේ දක්වා සේවා විස්තර :-

| සිට | දක්වා | මුළු කාලය | සේවා ස්ථානය(නගරය සඳහන් කරන්න) | දෙපාර්තමේන්තුව | කවර අමාත්‍යාංශය යටතේද? |
|---|---|---|---|---|---|
| | | | | | |

05. නිලධාරියා මාරුවීමට කැමති සේවා ස්ථාන තුනක් කැමැත්ත අනුව පිළිවෙලින් සඳහන් කරන්න.

| | සේවා ස්ථානය | එම සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය |
|---|---|---|
| i.<br>ii.<br>iii. | | |

06. ඉල්ලීම් කිරීමට හේතු :- ..........................................................................................................
..........................................................................................................................................

07. සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම් :- ...................................................................................
..........................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :-

නිලධාරියාගේ අත්සන

-----------------------------------------------------------------------------------------------------------

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

සුදුසු අනුප්‍රාප්තිකයකු සහිතව/රහිතව නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරනු ලැබේ. අදාල චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට එකඟ වෙමි.

දිනය :-.....................

......................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

# රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය (ඒකාබද්ධ සේවය)

01.1 ඒකාබද්ධ සේවයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් පහත දැක්වෙන ආකාරයෙන් සිදු කෙරේ.

### (අ) මාරු මණ්ඩල මගින් (වාර්ෂික ස්ථාන මාරු)

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් මණ්ඩල ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධාරියකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක/ප්‍රදේශයක නියමිත සේවා කාලය සම්පූර්ණ කල නිලධාරියකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමටද මාරු මණ්ඩල තීරණ ගත හැක. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මකවේ.

### (ආ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් මගින් (වාර්ෂික නොවන ස්ථාන මාරු)

වාර්ෂික මාරු මණ්ඩලවලදී හැර ඒකාබද්ධ සේවා අංශයේ දෛනිකව සිදුකෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරී කටයුතු වලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම්ද නිලධාරීන්ගේ හදිසි වූද, සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම්ද, අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

### 02:1 එක් අමාත්‍යාංශයක සිට තවත් අමාත්‍යාංශයකට මාරු කිරීම

එක් අමාත්‍යාංශයක සිට තවත් අමාත්‍යාංශයකට නිලධාරියකු මාරු කෙරෙන අවස්ථාවලදී පුරප්පාඩුව තිබෙන අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. මෙහිදී මාරුව ඉල්ලනු ලැබ සිටින නිලධාරියා අනුයුක්ත කොට සිටින රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වයද සලකා බලා පුරප්පාඩුව ඇති අමාත්‍යාංශයට ස්ථාන මාරුවීම් නියෝගය නිකුත් කිරීම රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ඇත.

### 02:2 එකම අමාත්‍යාංශයක් තුල දෙපාර්තමේන්තු අතර මාරු කිරීම

අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් යෝජිත ස්ථාන මාරු කිරීම් පිළිබඳ නිර්දේශ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. එම නිර්දේශ සලකා බලා අදාල ස්ථාන මාරුවීම සඳහා අනුමැතිය දීම රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ඇත.

### 02:3 එකම දෙපාර්තමේන්තුවක් තුළ ස්ථාන මාරු කිරීම

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ස්ථාන මාරුකිරීම් පිළිබඳ යෝජනා අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කල යුතුවේ. එම ඉල්ලීම අනුව ස්ථාන මාරු කිරීම අනුමත කිරීම අදාල අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකළ විටක ඒ බව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා එවිය යුතුය.

02:4 විශේෂ රාජකාරී අවශ්‍යතා හා හදිසි සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු කිරීම

පරිපාලනමය හා සේවා අවශ්‍යතා වලදී නිලධාරියකුගේ ඉල්ලීමක් නොමැතිව හා කැමැත්ත විමසීමකින් තොරව ස්ථාන මාරු කිරීමට හෝ තාවකාලිකව අනුයුක්ත කිරීමට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට හැකියාව ඇත.

## 03. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ ස්ථාන මාරු මණ්ඩල සංයුතිය

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන සේවයේ ආයතන කටයුතු භාර නිලධාරියා ඇතුළු මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු (ඉන් එක් අයකු අභියාචනා මණ්ඩල සඳහා නම් කරන ලද නිලධාරියකු විය යුතුය.)

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ නිලධාරීන්ගේ මුළු සේවක සංඛ්‍යාවෙන් 15% කට නොඅඩු ප්‍රමාණයක සාමාජිකත්වයක් හිමි වෘත්තීය සංගම් වලින් එක් නියෝජිතයකු බැගින්

හෝ

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියකු මුදා හැර ඇති එක් වෘත්තීය සංගමයක නියෝජිතයෙක්
යන අයගෙන් සමන්විත වේ.

මාරු මණ්ඩලයේ සභාපතිවරයා රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබයි.

## 04. අභියාචනා මණ්ඩල

04:1 මාරු මණ්ඩල තීරණ සම්බන්ධයෙන් හා මාරු මණ්ඩලවලදී තම ඉල්ලීම් ඉටු නොවීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ගේ සභාපතිත්වයෙන් යුත් අභියාචනා මණ්ඩලයක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබයි.

04:2 **අභියාචනා මණ්ඩලය පහත පරිදිය.**

සභාපති : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු :

I. රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු,
II. ඒකාබද්ධ සේවා අංශයට අයත් නොවන වෙනත් දෙපාර්තමේන්තුවක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු.

සටහන :- මෙම නිලධාරීන්ගෙන් එක් අයකු මාරු මණ්ඩලයේ සේවය කළ නිලධාරියකු විය යුතුය.

04:3 අභියාචනා මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධාරියාගේ ඉල්ලීම් ඉටු නොවූ අවස්ථා
- ස්ථාන මාරුව සම්බන්ධව අදාල අමාත්‍යාංශ ලේකම් වරුන් විසින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත කරන ඉල්ලීම්, නිර්දේශ හා පැමිණිලි.

## 05. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

05:1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. ( 2011 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2010.12.31 දිනය.)

05:2 සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධාරියාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු මණ්ඩලය ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

05:3 සේවා කාලය ගණනය කිරීමේදී එක් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුල අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

05:4 ප්‍රිය මනාප සේවා ස්ථානවල ගතකල සේවා කාලය ගණනය කිරීමේදී, පූර්වාසන්න වසර 15 තුල සේවය කළ ( එම කාල පරිච්ඡේදවල ප්‍රිය මනාප යයි හඳුන්වනු ලැබූ ) ප්‍රිය මනාප සේවා ස්ථාන කිහිපයක වුවද සේවා කාලයන්ගේ එකතුව ගණන් ගනු ලැබේ.

05.5 කිසියම් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කලද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කලද එම කාලවල මුළු එකතුව දිස්ත්‍රික්කය තුල සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

05.6 ප්‍රිය මනාප සේවා ස්ථානවල සේවා කාලය ගණන් ගැනීමේ දී නිලධාරියා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ සේවා කාලය තුලදී ප්‍රිය මනාප වූ සේවා ස්ථානයක සේවය කර ඇතිනම් එයද ගණන් ගනු ලැබේ.

05:7 දෙපාර්තමේන්තුවක සේවයකළ කාලය ගණන් ගැනීමේදී, නිලධාරියකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත, සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

05:8:1 පහසු සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක්/දුෂ්කර සේවා ස්ථානයක අවුරුදු 02 ක සේවා කාලයක් ඇති නිලධාරියෙක් ස්ථාන මාරු ලැබීමට සුදුසුකම් ලබයි.

05:8:2 පහසු සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේය.

05:8:3 වසර 05ට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වන්නේය.

05:9:1 වයස අවුරුදු 53 ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කය තුල වෙනත් සේවා ස්ථානයකට මාරුකළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකල යුතුය.

05:9:2 වයස අවුරුදු 58 ඉක්මවූ නිලධාරීන් (59 වැනි වියෙහි පසුවන්නන්) ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකල යුතුය.

05:10 වෘත්තීය සංගමයක මව් සංගමයේ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාල වෘත්තීය සමිතියේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය. ප්‍රිය මනාප දෙපාර්තමේන්තුවලින් පිටතට මාරු කිරීමට මෙය අදාල නොවේ.

05:11 ආයතන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදයේ 7:1 වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන වෘත්තීය සංගම්වල නිලධාරීන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කර ( 7:5 උප වගන්තිය අනුව) මාරු මණ්ඩල රැස්වීමට සති දෙකකටවත් පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වේ. මේ පිළිබඳව පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

05:12 යම් නිලධාරියකුගේ නිලධාරිනියකගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටින බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්නේ නම් එවැනි නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳ ප්‍රමුඛත්වය දිය යුතු අතර ඔවුන් මාරු කල යුත්තේ එම නිලධාරීන්ගේ ඉල්ලීම අනුව පමණි.

05:13 සෑම විටම නිලධාරියාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු වේ.

05:14 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් කල යුතු වේ.

05:15 දරුවන් පාසලට යැවීමේ කටයුතුවලට අවහිරයක් නොවන පිණිස හැකිතාක් දුරට සෑම ස්ථාන මාරු කිරීමක්ම ක්‍රියාත්මක විය යුත්තේ එක් එක් අවුරුද්දේ ජනවාරි මස 01 වන දින සිටය.

05:16 ප්‍රියමනාප නොවන්නාවූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා අවිවාහක නිලධාරීන් ද පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධාරීන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

05.:17 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස්කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස්කල අයදුම්පත් පිළිබඳව පමණි.

05:18 මාරුවීම් අයදුම් කරන නිලධාරීන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ නම් ප්‍රදේශයේ නම හා කාර්යාලයේ නම යන දෙකම සඳහන් කිරීම වරදක් නැත. තමන් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ කිසියම් ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මතද නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තු හෝ කාර්යාලයකට යාමට උවමනාවෙන්ද යන්න අයදුම්පතෙහි ඇඟවීමක් කිරීම සුදුසුය. ඒ අනුව තමන්ගේ කැමැත්ත අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කළ යුතු වේ.

05:19 නිලධාරියාගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නැත.

## 06. සේවා ස්ථාන වර්ගීකරණය

06:1:1 කිසියම් සේවා ස්ථානයකට/ප්‍රදේශයකට ස්ථාන මාරුවී යාමට නිලධාරීන් වැඩි පිරිසකගේ ඉල්ලීම්(තරගකාරී බවක්) ඇත්නම් එම සේවා ස්ථානය/ප්‍රදේශය ප්‍රියමනාප සේවා ස්ථානයක්/ප්‍රදේශයක් ලෙස හැඳින්වේ.

06:1:2 ස්ථාන මාරුවී යාමට ඉල්ලීම් අඩු ප්‍රමාණයක් ඇති සේවා ස්ථාන/ප්‍රදේශ ප්‍රිය මනාප නොවන සේවා ස්ථාන/ප්‍රදේශ වශයෙන් හැඳින්වේ.

06:1:3 දෙවන උපලේඛණයේ සඳහන් කාර්යාලයකට ස්ථාන මාරුවීමක් ඉල්ලා සිටියද එම සේවා ස්ථානයට ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමට පෙර ඒ පිළිබඳව උපලේඛණයේ දැක්වෙන දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරේ.

06:2 ප්‍රියමනාප සේවා ස්ථාන/ප්‍රදේශ ලෙස හඳුනාගත් සේවා ස්ථානවල/ප්‍රදේශවල නම්, සේවාවන් අනුව වාර්ෂිකව ප්‍රසිද්ධ කෙරේ. මෙම ස්ථාන හා ප්‍රදේශ නිලධාරීන්ගේ ප්‍රතිචාර අනුව විටින් විට වෙනස් විය හැක. **සේවාවන් අනුව ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස හඳුනාගත් දෙපාර්තමේන්තුවල නාමලේඛණයක් මේ සමග අමුණා ඇත.**

06:3 ප්‍රියමනාප සේවා ස්ථානයක හෝ ස්ථානවල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරු කල යුත්තේ වෙනත් ඉල්ලීම් නැත්නම් පමණි.

06:4 ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල/ප්‍රදේශවල වසර 05ට වඩා සේවය කල නිලධාරීන්ගේ නාම ලේඛණයක් ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථාන මාරු කලහොත් මාරුවී යාමට කැමති සේවා ස්ථාන 03ක්, යනාදී සියලු තොරතුරු අදාල ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වනු ලබන දිනට පෙර එවීම අදාල අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම වන්නේය.

06:5 සියලුම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවල වසර 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ වාර්තාවක් 5:5 උප වගන්තියේ දැක්වෙන පරිදි දිස්ත්‍රික්ක අනුව සකස් කර එවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරු ඉතා වගකීමෙන් යුතුව කටයුතු කළ යුතු වේ.

06:6 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක සේවයකල නිලධාරියෙකු ස්ථාන මාරුවීමක් ඉල්ලූ විට එම ඉල්ලීම ඉටු කිරීමට 6:4 හා 6:5 උප වගන්තිවල අවශ්‍යතා සපුරා ඇති එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියා ඉන් පිටතට මාරුකළ හැකිය.

06:7 ප්‍රියමනාප ප්‍රදේශවලට ස්ථාන මාරුවීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කල නිලධාරීන්ටය. එමෙන්ම සේවා කාලය හා නිලධාරීන් විසින් දැනුම් දී ඇත්නම් ඔවුන්ට ප්‍රායෝගිකව මුහුණ දීමට සිදුවන ප්‍රශ්න ද සලකා බලනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමට නිලධාරීන් කටයුතු කළ යුතුය.

06:8 06:4 හා 06:5 උප වගන්තිවල දැක්වෙන නිලධාරීන් පිටතට මාරු කිරීමේදී ඔවුන් කැමැත්ත දක්වා ඇති ස්ථාන 02ක් අතුරෙන් එකකට මාරු කිරීමට හැකිතාක් උත්සාහ ගන්නා අතර එසේ නොහැකි වුවහොත් හැකි ආසන්න ස්ථානයකට මාරු කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමට නිලධාරීන් කටයුතු කළ යුතුය.

06:9 ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධාරීන් ගේ රාජකාරී, කල් ඇතිව වෙනත් නිලධාරීන්ට පුහුණුකර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කල යුතුය.

07. වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් පිළිනොපදින හෝ ක්‍රියාත්මක නොකරන නිලධාරීන් පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්තා වුවහොත්, ඒ පිළිබඳව තව දුරටත් දැනුම් දීමකින් තොරව අදාල විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

08. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මන කිරීමේදී අනුගමනය කලයුතු කාල සටහන.

| | | |
|---|---|---|
| සැප්තැම්බර් පළමු සතිය තුල | - | ස්ථාන මාරු පරිපාටිය/චක්‍රලේඛය ප්‍රසිද්ධකර ඉල්ලුම්පත් කැඳවීම. |
| සැප්තැම්බර් අවසන් සතිය තුල | - | ඉල්ලුම්පත් සහ වසර 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරීන්ගේ වාර්තා ලබා ගැනීම අවසන් කිරීම. |
| ඔක්තෝබර් දෙවන සතිය තුල | - | මාරු මණ්ඩල රැස්වී තීරණ ගෙන අවසන් කිරීම. |
| ඔක්තෝබර් අවසන් සතිය තුල | - | ස්ථානමාරු දැනුම් දීම. |
| නොවැම්බර් දෙවන සතිය තුල | - | ස්ථාන මාරු පිළිබඳව ඒකාබද්ධ සේවා අංශය වෙත අභියාචනා ලබා ගැනීම අවසන් කිරීම. |
| නොවැම්බර් අවසන් සතිය තුල | - | ඉහත අභියාචනා පිළිබඳ තීරණ ගෙන අවසන් කිරීම. |
| දෙසැම්බර් දෙවන සතිය තුල | - | අභියාචනා මණ්ඩල තීරණ දැනුම් දීම. |

ඩී.දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

## 1 වන උප ලේඛණය
## ප්‍රියමනාප දෙපාර්තමේන්තු

01. රේගු දෙපාර්තමේන්තුව.

02. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.

03. විභාග දෙපාර්තමේන්තුව.

04. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

05. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව.

06. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

07. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

08. සුරාබදු දෙපාර්තමේන්තුව.

09. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

10. විදේශ කටයුතු අමාත්‍යාංශය.

## 2 වන උප ලේඛණය.
## පූර්ව අනුමැතියට යටත්ව මාරුවීම් කරන දෙපාර්තමේන්තු

01. ජනාධිපති කාර්යාලය.

02. අග්‍රාමාත්‍ය කාර්යාලය.

03. අමාත්‍ය මණ්ඩල කාර්යාලය.

04. විපක්ෂ නායක කාර්යාලය.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

06. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව.

07. මැතිවරණ දෙපාර්තමේන්තුව.